විදේශ කටයුතු අමාත්‍යාංශය
**வெளிநாட்டு அலுவல்கள் அமைச்சு**
**Ministry of Foreign Affairs**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව, குடியரசு கட்டிடம், கொழும்பு 1, Republic Building, Colombo 1, Sri Lanka

**මාධ්‍ය නිවේදනය**

**කැන්බරා නුවර හිටපු ශ්‍රී ලංකා නියෝජ්‍ය මහකොමසාරිස්වරියට එරෙහිව පවරන ලද නඩුවක් සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ෆෙඩරල් අධිකරණය විසින් ලබා දුන් තීන්දුව පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිචාරය**

කැන්බරා නුවර හිටපු ශ්‍රී ලංකා නියෝජ්‍ය මහකොමසාරිස්වරියට එරෙහිව පවරන ලද නඩුවක් සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ෆෙඩරල් අධිකරණය විසින් ලබා දුන් තීන්දුව පිළිබඳව පළ වී ඇති පුවත් වාර්තා කෙරෙහි විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවධානය යොමුවී තිබේ.

ඔවුන්ගේ නිල නියෝජන රාජකාරිවලට සහය වීම පිණිස ගෘහ සහායක සහායිකාවන් රැගෙන යෑම සඳහා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ට විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පහසුකම් සැලසීම සාමාන්‍ය සිරිත බව විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රකාශ කරයි. මෙම සිද්ධියට අදාළ ගෘහ සහායිකාව තුන් වසරක පූර්ණ සේවා කාලයක් නිමා කොට තිබූ අතර, ස්වකීය සේවායෝජිකාව ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව ඒමට අදහස් කොට තිබූ දිනට පෙර දින සේවායෝජිකාවගේ නිල නිවෙසින් රහසින් පළා ගියාය.

ගෘහ සහායිකාවගේ වැටුප වශයෙන් අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබූ දීමනාව ඇයට ගෙවා තිබේ. අන්‍යෝන්‍ය වශයෙන් ගිවිස ගත් පරිදි සේවායෝජිකාව විසින් ගෘහ සහායිකාවට එම වැටුප ගෙවන ලද බවට අමාත්‍යාංශය සෑහීමට පත් වෙයි.

**විදේශ කටයුතු අමාත්‍යාංශය**
**කොළඹ**
**2024 අගෝස්තු 17 වැනිදා**